# FINANCIAL MANAGEMENT (Part-VI)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## මූල්‍ය වෙළෙඳ පොළ

අරමුදල් සපයන්නන් හා අරමුදල් ඉලල්ම් කරන්නන් සම්බන්ධ කිරීම සඳහා පවත්නා ස්ථානයක් හෝ අවකාශයක් මූල්‍ය වෙළෙඳ පළක් ලෙස හැඳින්වේ. මූල්‍ය වෙළෙඳ පොළෙහි මූල්‍ය වත්කම් මිල දී ගැනීම හා විකිණීම සිදු කරයි.

## මූල්‍ය වෙළෙඳ පොළ සංයුතිය

මූල්‍ය වෙළෙඳ පොළේ සංයුතිය පහත දැක්වෙන වෙළෙඳ පොළවලින් සමන්විත වේ.

- අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳ පොළ
- දේශීය විදේශීය විනිමය වෙළෙඳ පොළ
- රජයේ සුරැකුම්පත් වෙළෙඳ පොළ
    - භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ
    - භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳ පොළ

ClassWork.LK

- සාංගමික ණය සුරැකුම්පත් වෙළෙඳ පොළ
    - වාණිජ පත්‍රිකා වෙළෙඳ පොළ
    - සාංගමික බැඳුම්කර (ණයකර) වෙළෙඳ පොළ
    - කොටස් වෙළෙඳ පොළ

මූල්‍ය උපකරණවල කල්පිරීමේ කාලය පදනම් කරගෙන මූල්‍ය වෙළෙඳ පොළ පහත පරිදි වර්ග කළ හැකි ය.

- මුදල් වෙළෙඳ පොළ
- ප්‍රාග්ධන වෙළෙඳ පොළ

ClassWork.LK

# මූල්‍ය වෙළෙඳපොළ සංයුතිය ගැලීම් සටහනකින්

මූල්‍ය වෙළෙඳ පොළ

- මුදල් වෙළෙඳ පොළ
  - අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳ පොළ
  - දේශීය-විදේශීය විනිමය වෙළෙඳ පොළ
  - භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ
    - ප්‍රාථමික
    - ද්විතීයික
  - වාණිජ පත්‍රිකා වෙළෙඳ පොළ
- ප්‍රාග්ධන වෙළෙඳ පොළ
  - භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳ පොළ
  - සාංගමික බැඳුම්කර වෙළෙඳ පොළ
  - කොටස් වෙළෙඳ පොළ

ClassWork.LK

## ❖ මුදල් වෙළෙඳ පොළ

කෙටි කාලීන මූල්‍ය උපකරණ මිල දී ගැනීම හා විකිණීමට අදාළ වෙළෙඳ පොළ මුදල් වෙළෙද පොළ (Money Market) ලෙස හැදින්විය හැකිය.

### • අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳ පොළ

වාණිජ බැංකු අතර කෙටිකාලීන ණය ඉල්ලුම් සහ ණය සැපයුම් සිදු වන වෙළෙඳ පොළ යි. ද්‍රවශලීතා හිඟයෙන් පෙළෙන බැංකු සිය ද්‍රවශීගතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අතරික්ත ද්‍රවශීලතාවක් සහිත වාණිජ බැංකුවලින් දින හතකින් හෝ ඊට අඩු කාලයකින් හෝ පියවීමට යටත් ව මුදල් ණයට ගැනීම ඒක්ෂණ ණය ගනුදෙනු ලෙස හැඳින්වෙන අතර එම ගනුදෙනු සිදු වන වෙළෙඳ පොළ **අන්තර් බැංකු ඒක්ෂණ ණය වෙළෙඳ පොළ** ලෙස හැඳින්වේ.

ClassWork.LK

ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති එම බැංකු සතු සංචිත ගිණුම් හරහා මෙම ගනුදෙනු සිදු කරයි.

- **<u>දේශීය විදේශීය විනිමය වෙළෙඳ පොළ</u>**

රටෙහි විදේශ විනිමය යොදා ගෙන කෙටි කාලීන ණය ගැනීම හා කෙටි කාලීන ණය සැපයීම සිදු වන වෙළෙඳ පොළ යි.

නැතහොත් වාණිජ බැංකුවල විදේශ ව්‍යාවහාර මුදල් ගනුදෙනුවලට අදාළ ව සිදුවන කටයුතු මේ නමින් හැඳින්වේ.

අපනයනකරුවන් ලබා ගන්නා විදේශ මුදල් වාණිජ බැංකුවලට විකුණු ශ්‍රී ලංකා රුපියල් ලබා ගැනීම, ආනයනකරුවන් ශ්‍රී ලංකා රුපියල් ලබා දී විදේශ මුදල් මිල දී ගැනීම, ණයවර ලිපි නිකුත් කිරිම, විදේශ බැංකු අණකර නිකුත් කිරිම ආදි ගනුදෙනු මෙහි දී සිදු වේ.

ClassWork.LK

## • භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ

රජයට අවශ්‍ය කෙටිකාලීන ණය දේශීය මුදලින් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මූල්‍ය උපකරණය භාණ්ඩාගාර බිල්පත් ලෙස හැඳින්වේ. මෙම භාණ්ඩාගාර බිල්පත් විකිණීම හා මිල දී ගැනීම සිදු වන වෙළෙඳ පොළ භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ යි.

## භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳ පොළ වර්ගීකරණය

### 1. භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළෙඳ පොළ

ශ්‍රී ලංකා මහ බැංකුව බිල්පත් ප්‍රාථමික වෙළෙඳ පොළ ලෙස සැලකේ.

ClassWork.LK

## 2. භාණ්ඩාගාර බිල්පත් ද්විතීයක වෙළෙඳ පොළ

ප්‍රාථමික වෙළෙඳ පොළෙන් මිලට ගත් භාණ්ඩාගාර බිල්පත් කල් පිරෙන තෙක් තබා නොගෙන භාණ්ඩාගාර බිල්පත් විකිණීම හා මිල දී ගැනීම සිදු වන වෙළෙඳ පොළ යි.

- <u>වාණිජ පත්‍රිකා වෙළෙඳ පොළ</u>

සමාගම් තම කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා නිකුත් කරනු ලබන පත්‍රිකා විශේෂය වාණිජ පත්‍රිකා ලෙස හැඳින්වේ. වාණිජ පත්‍රිකා විකිණීම හා මිලට ගැනීම සිදු වන වෙළෙඳ පොළ වාණිජ පත්‍රිකා වෙළෙඳ පොළ ලෙස හැඳින්වේ.

ClassWork.LK

## ❖ ප්‍රාග්ධන වෙළෙඳ පොළ

වර්ෂයකට වඩා වැඩි කාලයක දී කල් පිරෙන මූල්‍ය උපකරණ ගනුදෙනු සිදු වන වෙළෙඳ පොළ මේ නමින් හඳුන්වයි. එනම් දිගු කාලීන අරමුදල් අවශ්‍යතා ඇති පාර්ශ්ව හා දිගු කාලීන මුදල් අතිරික්තතා ඇති පාර්ශ්ව අතර ගනුදෙනු සිදු වන වෙළෙඳ පොළ ප්‍රාග්ධන වෙළෙඳ පොළ (Capital Market) ලෙස හඳුන්වයි.

- **භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳ පොළ**

රජයට අවශ්‍ය මධ්‍ය හා දිගු කාලීන ණය දේශීය මුදලින් ලබා ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන නිර්ලේඛන සුරැකුම්පත් විශේෂණය භාණ්ඩාගාර බැඳුම්කර ලෙස හැඳින්වේ. මේවා හුවමාරු වන වෙළෙඳ පොළ භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳ පොළ වේ.

ClassWork.LK

සුරක්ෂිත මූල්‍ය උපකරණයක් වන මෙය රුපියල් දස දහස් ගුණිතයන්ගෙන් යුක්ත ව මිල දී ගත හැකි ය. වසර දෙකේ සිට තිහක් තෙක් කල් පිරෙන සීමාවන්ගෙන් යුක්ත ව නිකුත් කරයි.

- **<u>සාංගමික බැඳුම්කර වෙළෙඳ පොළ</u>**

රාජ්‍ය සංස්ථා හා සීමිත පොදු සමාගම් විසින් මධ්‍ය හා දිගුකාලීන අරමුදල් සපයා ගැනීම සඳහා නිකුත් කරන බැඳුම්කර (ණයකර) අලෙවි කිරීම සම්බන්ධ කටයුතු සිදු කෙරෙනපවෙළෙඳ පොළ මෙය වේ. සාංගමික බැඳුම්කර කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත කර කොටස් වෙළෙඳ පොළේ හුවමාරු කිරීමට ද හැකිය.ාව ඇත.

- **<u>කොටස් වෙළෙඳ පොළ</u>**

ලැයිස්තුගත සමාගම් විසින් නිකුත් කරන කොටස් හා ණයකර ආදී සුරැකුම්පත් මිල දී ගැනීම හා විකිණීම සිදු කරන වෙළෙඳ පොළ කොටස් වෙළෙඳ පොළ වේ.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura